පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# අවසාන වාර පරීක්ෂණය - 2019

## ගෘහ ආර්ථික විද්‍යාව - II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

**කාලය පැය 03 යි**
**කියවීම් කාලය විනාඩි 10 යි**

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 06කට පිළිතුරු සපයන්න.**

01.

i. ප්‍රශස්ත ජීවන පරිසරයක ප්‍රධාන අංශ දෙක නම් කරන්න.
ii. කාබෝහයිඩ්‍රේට් මගින් ශරීරය තුළ ඉටුකරන කෘත්‍යයන් 04ක් ලියන්න.
iii. දුෂ්පෝෂණය යන්න පැහැදිලි කරන්න.
iv. තුලිත ආහාර වේලක් සැලසුම් කිරීමේදී උපයෝගී කරගතයුතු මූලාශ්‍ර 04ක් ලියන්න.
v. ආහාර ආකලන යන්න කෙටියෙන් හඳුන්වා එයට උදාහරණ 02ක් ලියන්න.
vi. ආහාර ජීර්ණය කෙරෙහි බලපාන සාධක නම් කරන්න.
vii. ඇඟලුම් කර්මාන්තය නිසා ඇතිවිය හැකි වෙනත් කර්මාන්ත 04ක් ලියන්න.
viii. ''පිරි සැලසුම'' කෙටියෙන් හඳුන්වන්න.
ix. මලහරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
x. පුද්ගල ආරක්ෂාව සඳහා රෙදිවලට ලබාදෙන නිමාවන් මොනවාද?

(ලකුණු 10 x 2 = 20)

02.

i. අභ්‍යන්තර අවකාශ නිර්මාණය යනු කුමක්ද? (ලකුණු 04)
ii. නාගරික පරිසරයක පොදු ලක්ෂණ මොනවාද? (ලකුණු 04)
iii. නිර්මාණකරණයේදී සංකල්පීය එළඹුම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. උදාසීන වර්ණ නම්කර වර්ණවල ගුණාංග පැහැදිලි කරන්න. (ලකුණු 04)

03.

i. කාබෝහයිඩ්‍රේට් ඒවායේ අඩංගු තැනුම් ඒකක අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 04)
ii. නිරෝගී දිවියකට ජලය හා තන්තුවල වැදගත්කම පහදන්න. (ලකුණු 04)
iii. අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. ලිපිඩ මගින් ඉටුවන කෘත්‍යයන් 04ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

04.

i. පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය නියමිත පරාසය තුළ පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. විමසන්න. (ලකුණු 04)
ii. පහත දක්වා ඇති ආහාර ඊට ඉදිරියෙන් ඇති රෝගය පාලනය කරගැනීම හෝ මඟහරවා ගැනීමට ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04)
   - කොහිල ව්‍යාංජනය - දියවැඩියාව
   - බේක් කරන ලද කට්ලට් - හෘද රෝග
   - බෙලි යුෂ - මලබද්ධය
   - මාළු ඇඹුල්තියල් - අධිරුධිර පීඩනය

iii. පුද්ගලයෙකුට උදය ආහාරවේල වැදගත් වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. හෘදයාබාධ ඇතිවීමට හේතු වියහැකි කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න (ලකුණු 04)

Education NCP - www.edncp.lk

05.

i. ආහාර ආකලන ද්‍රව්‍ය යනු මොනවාද? ආහාරවලට ආකලන ද්‍රව්‍ය එකතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පහත ද්‍රව්‍ය මිලදීගැනීමේදි සලකා බැලිය යුතු කරුණු 02 බැගින් ලියන්න. (ලකුණු 04)

- මස් වර්ග
- එළවළු වර්ග
- කිරි හා කිරි නිෂ්පාදන
- ධාන්‍ය හා මාෂබෝග

iii. උත්සව අවස්ථාවක් සඳහා ආහාරවේල් සැලසුම් කිරීමේදී සැලකිළිමත් වියයුතු කරුණු 04ක් ලියන්න.(ලකුණු 04)

iv. අ) සුළු කෑම යනු මොනවාදැයි හඳුන්වා ඊට උදාහරණ දක්වන්න. (ලකුණු 02)
ආ) එක් සුළු කෑමක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය නම් කර එය සාදන අන්දම ලියා දක්වන්න. (ලකුණු 02)

06.

i. පේෂකර්ම (රෙදිපිළි) නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික පියවර 04 ලියන්න. (ලකුණු 04)

ii. ඇඟළුම් කර්මාන්තයට අනුව පතරොම් සකස් කිරීම යනු කුමක්ද? (ලකුණු 04)

iii. මේස රෙද්දක් නිර්මාණය කිරීමේදී එහි අලංකාරය වැඩිකිරීමට
අ) යොදාගනු ලබන මෝස්තරයක් අඳින්න. (ලකුණු 02)
ආ) එය මැසීමට යොදාගන්නා මැහුම් ක්‍රම 04ක් ලියන්න. (ලකුණු 02)

iv. වාණිජ මැහුම් ක්‍රම 04ක් නම් කරන්න. (ලකුණු 04)

07.

i. කෙඳි වර්ගීකරණය කර දක්වන්න. (ලකුණු 04)

ii. කෙඳිවල භෞතික ගුණාංග හා රසායනික ගුණාංග 02 බැගින් ලියන්න. (ලකුණු 04)

iii. අ) කෙටි සායේ මූලික පතරොම සකස් කිරීමට අවශ්‍ය මිමි 04ක් නම් කරන්න. (ලකුණු 02)
ආ) ඉණ මිනුම ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

iv. රෙදි හා ඇඳුම් අලංකාර කිරීමේ ක්‍රම දක්වා ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න. (ලකුණු 04)

08. පහත සඳහන් මාතෘකා අතරින් 04ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 4 x 4 = 16)

a. පෙර පිරියම් කිරීම
b. ඇඟළුම් කර්මාන්තයේ වැදගත්කම
c. අතුරුපස
d. බෝ නොවන රෝග
e. මානව ආහාර ජීර්ණ පද්ධතිය

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019
## ගෘහ ආර්ථික විද්‍යාව - I

පාසලේ නම : ......................................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය : පැය 2 යි.

**සැලකිය යුතුයි :-**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

Education NCP - www.edncp.lk

1. පහත ප්‍රකාශ අතරින් **සත්‍ය** වන්නේ,

A - ශ්‍රී ලංකාවේ ආදි මානවයා අහිතකර පරිසර සාධකවලින් ආරක්ෂාවීමට ගල්ගුහා භාවිත කළේය.

B - බලංගොඩ මානවයා ගල්ගුහා ආශ්‍රිතව ජීවත් වූ බවට සාක්ෂි ඇත.

C - ජීවන පරිසරය හා ජීවන රටාව අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ඇත.

(1) A පමණි (2) B පමණි (3) C පමණි
(4) A හා C පමණි (5) B හා C පමණි

2. ප්‍රශස්ථ ජීවන පරිසරයක ප්‍රධාන අංග දෙක වනුයේ,
(1) භෞතික පරිසරය හා සමාජ පරිසරය යි
(2) භෞතික පරිසරය හා බාහිර පරිසරය යි
(3) භෞතික පරිසරය හා අභ්‍යන්තර පරිසරය යි
(4) සමාජ පරිසරය හා දේශපාලන පරිසරය යි
(5) දේශපාලන පරිසරය හා ආර්ථික පරිසරය යි

3. පහත සඳහන් ප්‍රකාශ අතරින් ගොඩනැගිලි හා භූ දර්ශන නිර්මාණය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය කුමක්ද?
(1) ගොඩනැගිල්ල මෙන්ම අවට භූමියද නිර්මාණාත්මකව සකස් කිරීම.
(2) ස්වභාවික මෙන්ම කෘතිම අමුද්‍රව්‍යය භාවිතා කිරීම.
(3) ගොඩනැගිල්ල තුල කිරීමට අපේක්ෂිත කාර්ය මනාව ඉටුකරගැනීමට හැකි වීම.
(4) ආරම්භක යුගයේ ගඩොල් බිත්ති හා උළු වහල සහිතව නිවාස ඉදිකිරීම.
(5) පුද්ගලයාගේ සමාජ මට්ටම අනුව විවිධ ප්‍රමාණයේ ගොඩනැගිලි ඉදි කිරීම.

4. ශ්‍රී ලාංකික නගර නිර්මාණ ශිල්පයේ පැවති දියුණු ඉංජිනේරුමය හා ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ පහසුවෙන් හඳුනාගත හැකි ස්ථානයකි.
(1) දළදා මාළිගාව (2) මහමෙව්නා උයන (3) රන්මසු උයන
(4) යාපහුව (5) සීගිරිය

5. අනුරාධපුර නගරයේ ඇති කුකුළු ගොවිපොළක වහලය උස්ව හා කවුළු සහිතව හොඳින් වායු සංසරණය වනසේ තනා ඇත. මෙමගින් නිර්මාණකරණයේ කවර උපයෝගීතා සාධකය ගම්‍යවේද?
(1) අනුකූලත්වය
(2) කලාත්මකබව
(3) කාල අවකාශ නිර්ණය
(4) සැකැස්ම හා පිහිටීම
(5) ප්‍රමාණය හා සමානුපාතිකබව

6. ගොඩනැගිලි නිර්මාණයේදී බිත්ති සකස් කිරීම පිළිබඳව **සත්‍ය** ප්‍රකාශය වන්නේ.
(1) බිත්ති සඳහා ද්‍රව්‍ය තෝරා ගැනීමේදී දිශානතිය වැදගත් නොවේ.
(2) නැගෙනහිර බස්නාහිර දිශාවට ගඩොල් බිත්ති යොදා ගැනීම සුදුසුය.
(3) නැගෙනහිර බටහිර දිශාවට ඝනකම අඩු බිත්ති යෙදිය හැක.
(4) උතුරට හා දකුණට ඝනකම වැඩි ගඩොල් බිත්ති අවශ්‍යය වේ.
(5) ගඩොල් බිත්ති යෙදීමෙන් අභ්‍යන්තර අවකාශය රත් වේ.

7. අක් වක් රේඛා මගින් නිරූපනය වන්නේ
(1) කලබලකාරීබව (2) ප්‍රීතිමත්බව (3) සුන්දරබව
(4) ශාන්තබව (5) සෘජුබව

8. පහත සඳහන් ප්‍රකාශ අතරින් **සත්‍ය** ප්‍රකාශය වන්නේ
(1) රතු සහ නිල් සමාන ප්‍රමාණ වලින් එක්වී කොළ සෑදේ
(2) කහ සහ නිල් සමාන ප්‍රමාණ වලින් එක්වී දම් සෑදේ
(3) රතු සහ කහ සමාන ප්‍රමාණ වලින් එක්වී තැඹිලි සෑදේ
(4) රතු සහ කහ සමාන ප්‍රමාණ වලින් එක්වී දම් සෑදේ
(5) කහ සහ නිල් සමාන ප්‍රමාණවලින් එක්වී තැඹිලි සෑදේ

9. ප්‍රාථමික වර්ණ ලෙස හඳුන්වනුයේ.
(1) රතු, කහ සහ නිල් ය (2) රතු, කහ සහ කොළ ය
(3) කහ, නිල් සහ කොළ ය (4) නිල්, කොළ සහ රතු ය
(5) නිල්, රතු සහ දම් ය

10. පහත සඳහන් පෝෂක අතරින් මහා පෝෂක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන , ලිපිඩ
(2) කාබෝහයිඩ්‍රේට් , ප්‍රෝටීන , විටමින්
(3) කාබෝහයිඩ්‍රේට් , ප්‍රෝටීන , ඛනිජ
(4) ප්‍රෝටීන ,ලිපිඩ, විටමින්
(5) ලිපිඩ, විටමින්, ඛනිජ

11. ශිෂ්‍යයකු විසින් ආහාරවල අන්තර්ගත සීනි පිළිබඳව ලියා ඇති වගන්ති කිහිපයක් පහත දැක්වේ.
A - මී පැණි වල ෆෲක්ටෝස් අඩංගු වේ.
B - නිවසේ භාවිත වන සීනි වල මෝල්ටෝස් අඩංගු වේ.
C - ප්‍රරෝහනය වන ධාන්‍ය වල මෝල්ටෝස් ඇත.

මෙම වගන්ති අතුරින් සත්‍ය වන්නේ,
(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) ඉහත සියල්ලම

12. පලතුරුවල බහුලව අන්තර්ගත සීනි වර්ගය වන්නේ,
(1) ග්ලූකෝස් ය. (2) ෆෲක්ටෝස් ය. (3) ගැලැක්ටෝස් ය.
(4) මෝල්ටෝස් ය. (5) ලැක්ටෝස් ය.

13. අල හා ධාන්‍ය වර්ගවල ගබඩා වී ඇති කාබෝහයිඩ්‍රේට් වර්ගය වන්නේ
(1) පිෂ්ඨය (2) ග්ලයිකොජන් (3) ඇමයිලෝස්
(4) සෙලියුලෝස් (5) මෝල්ටෝස්

14. සත්ත්ව ශරීරය තුළ ශක්තිය සංචිත කර ඇත්තේ පහත සඳහන් කිනම් ආකාරයට ද?
(1) පිෂ්ඨය (2) ග්ලයිකොජන් (3) ඇමයිලෝස්
(4) සෙලියුලෝස් (5) මෝල්ටෝස්

15. ඇමයිනෝ අම්ල අතරින් සරලම ඇමයිනෝ අම්ලය වන්නේ,
(1) ලියුසීන් ය. (2) ග්ලයිසීන් ය. (3) වැලින් ය.
(4) සෙරීන් ය. (5) ලයිසීන් ය.

16. ප්‍රෝටීන පිළිබඳ සපයා ඇති පහත සඳහන් වගන්ති අතරින් සත්‍ය වන්නේ,
A - ශරීරය තුළ ප්‍රෝටීන ගබඩා කළ නොහැකිය.
B - ශරීරයට වැඩිපුර ලබාගන්නා ප්‍රෝටීන ශරීරයෙන් බැහැර වේ.
C - ළදරුවන්ගේ ප්‍රෝටීන අවශ්‍යතාව වැඩිහිටියන්ට වඩා වැඩිය.
(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි
(4) A හා C පමණි (5) සියල්ලම

17. ඔලිව් තෙල්වල අඩංගු ඔලෙයික් අම්ලය,
(1) සංතෘප්ත මේද අම්ලයකි (2) ඒක අසංතෘප්ත මේද අම්ලයකි
(3) බහු අසංතෘප්ත මේද අම්ලයකි (4) ශරීරයට අත්‍යාවශ්‍ය මේද අම්ලයකි
(5) ද්විත්ව බන්ධන දෙකක් අඩංගු මේද අම්ලයකි

Education NCP - www.edncp.lk

18. ශරීරයට අත්‍යාවශ්‍ය බහු අසංතෘප්ත ඔමේගා 3 මේද අම්ලයක් වන ලිනොලෙනික් අම්ලය අඩංගු ආහාරයක් වනුයේ,

(1) රටකජු තෙල් (2) පොල් තෙල් (3) ඔලිව් තෙල්
(4) ෆාම් තෙල් (5) මාළු තෙල්

19. පහත දැක්වෙන පිළිතුරු අතරින් ජල ද්‍රාව්‍ය විටමින් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) විටමින් A හා E (2) විටමින් B හා C (3) විටමින් B හා D
(4) විටමින් A හා D (5) විටමින් E හා K

20. ආහාර කර්මාන්තයේදී ප්‍රතිඔක්සිකාරකයක් ලෙස භාවිත වන විටමිනය වනුයේ,

(1) විටමින් A (2) විටමින් B (3) විටමින් K (4) විටමින් D (5) විටමින් E

21. රුධිරය කැටිගැසීමට අවශ්‍යවන මේද ද්‍රාව්‍ය විටමිනය වනුයේ,

(1) විටමින් A (2) විටමින් B (3) විටමින් D (4) විටමින් E (5) විටමින් K

22. ආහාරවල රසායනික ජීරණය ආරම්භවන ස්ථානය හා ඊට අදාළ එන්සයිමය නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,

(1) ආමාශයේදී ඇමයිලේස් මගින් (2) මුඛයේ දී ට්‍රිප්සින් මගින්
(3) කුඩා අන්ත්‍රයේදී පෙප්සින් මගින් (4) මුඛයේදී ඇමයිලේස් මගින්
(5) මුඛයේදී පෙප්සින් මගින්

23. ආමාශයේ ඇති ආම්ලික ආහාර (ආමලසය) ආපසු අන්නශ්‍රෝතය වෙත ගමන් කිරීම වැළැක්වීමට ඇති යාන්ත්‍රණය කුමක්ද?

(1) ආලාර චක්‍ර පිධානය (2) හෘදාසන්න චක්‍ර පිධානය
(3) ආමාශයේ J හැඩති ව්‍යුහය (4) ආමාශයික යුෂ ස්‍රාවය වීම.
(5) ආහාර දියර තත්ත්වයේ පැවතීම

24. පිෂ්ඨය ජීර්ණයවීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ඇමයිලේස් මගින් ජීර්ණය වේ.
(2) මුඛයේදී පිෂ්ඨය ජීර්ණයවීම ආරම්භ වේ.
(3) පිෂ්ඨය ජීර්ණය ආමාශයේදී වේගවත් වේ.
(4) අග්න්‍යාශයික යුශයේ ඇමයිලේස් අන්තර්ගතය.
(5) ආන්ත්‍රික යුෂයේ ඇමයිලේස් අන්තර්ගතය.

25. ලංකාවේ පෝෂණ ඌනතා බහුලව ඇතැයි හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) නුවරඑළිය, බදුල්ල, ත්‍රිකුණාමලය
(2) නුවරඑළිය, බදුල්ල, ගාල්ල
(3) මඩකලපුව, යාපනය, මහනුවර
(4) ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය
(5) බදුල්ල, ත්‍රිකුණාමලය, මහනුවර

26. ශ්‍රී ලංකාවේ අඩුබර උපත් වැඩියෙන්ම වාර්තා වන්නේ කුමන දිස්ත්‍රික්කයෙන්ද?

(1) නුවරඑළිය (2) බදුල්ල (3) අම්පාර
(4) ගම්පහ (5) යාපනය

27. ශ්‍රී ලාංකිකයින් අතරින් වැඩිදෙනෙකු ඌනතා ලක්ෂණ පෙන්වන ක්ෂුද්‍ර පෝෂක නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) යකඩ, අයඩින්, විටමින් A (2) අයඩින් , කැල්සියම්, විටමින් A
(3) යකඩ, කැල්සියම්, විටමින් A (4) අයඩින්, කැල්සියම්, විටමින් B
(5) යකඩ, අයඩින් , විටමින් B

28. උස 160 cm සහ බර 60kg වන පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය අගය (BMI) වනුයේ,

(1) 24. 6 (2) 23. 4 (3) 25 (4) 25. 6 (5) 24. 9

29. තීව්‍ර මන්දපෝෂණය හේතුවෙන් ඇතිවිය හැකි තත්වයක් වනුයේ,

(1) උසට සරිලන බර නොතිබීම (2) වයසට සරිලන බර නොමැතිවීම
(3) වයසට සරිලන උස නොමැතිවීම (4) මිටිවීම
(5) රක්තහීනතාවය

30. හීම් යකඩ අඩංගු ආහාර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) කුකුළු මස්, මාළු සෝයා. (2) පීකුදු, බිත්තර, සෝයා.
(3) පීකුදු, මාළු, කවුපි. (4) කරවල, පීකුදු, හාල්මැස්සන්
(5) කව්පි, කරවල, පීකුදු

Education NCP - www.ednpc.lk

31. ළමා වියේදී ශරීරයට අවශ්‍ය කැල්සියම් ප්‍රමාණවත් ලෙස නොලැබීම නිසා හටගන්නා රෝගයක් වන්නේ,

(1) ගලගණ්ඩය
(2) ඔස්ටියෝපොරෝසිස්
(3) රිකට්සියාව
(4) ඔස්ටියෝමැලේෂියාව
(5) බැරිබැරියාව

32. පහත සඳහන් ඌනතා ලක්ෂණ පිළිබඳ සලකා බලන්න

- හිසකෙස් ගැලවීම
- සම වියළීම
- තුවාල සුව වීම ප්‍රමාද වීම

පහත දැක්වෙන කවර පෝෂකය ප්‍රමාණවත්ව නොලැබීමෙන් ඉහත සඳහන් ඌනතා ලක්ෂණ ඇති විය හැකිද?

(1) අයඩින්
(2) යකඩ
(3) සින්ක්
(4) විටමින් A
(5) කැල්සියම්

33. ශ්‍රී ලංකාවේ වැඩිපුරම පෝෂණ ගැටළු දැකිය හැකි වයස් කාණ්ඩය/කාණ්ඩ වන්නේ,

(1) ළමා අවධිය
(2) මාතෘ අවධිය
(3) ළමා හා මාතෘ අවධි
(4) තරුණ අවධිය
(5) වැඩිහිටි අවධිය

34. මස් වර්ග බාබකියු කිරීමේදී එම ආහාරය,

(1) තාප ප්‍රභව දෙකක් අතර තබා පිසගනී.
(2) තාප ප්‍රභවයට පහළින් තබා පිසගනී.
(3) අධික පීඩනයක් යටතේ අඩු කාලයකින් පිසගනී.
(4) තාප ප්‍රභවයට ඉහළින් තබා පිසගනී.
(5) ආහාරය මත වරින් වර මේදය ආලේප කරයි.

35. කට්ලට් බැදීමේදී යොදා ගැනෙන තාප සංක්‍රාමණ ක්‍රමය වනුයේ,

(1) සංනයනය
(2) සංවහනය
(3) විකිරණය
(4) සංවහනය හා විකිරණය
(5) සංනයනය හා විකිරණය

36. ශ්‍රී ලංකාවේ දැනට රෙදි පිළි කර්මාන්තය හා ඒ ආශ්‍රිත රැකියාවල නියුතු පුද්ගලයන්ගේ සංඛ්‍යාව දළ වශයෙන් ලක්ෂ,

(1) දෙකකි
(2) හතරකි
(3) හයකි
(4) දහයකි
(5) පහළොවකි

37. ඇඟලුම් නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ පියවර නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන්නේ.

(1) රෙදිවල තත්ත්ව පරීක්ෂාව, කැපීම, මැසීම, නිමාව ය.
(2) කැපීම, මැසීම, රෙදිවල තත්ත්ව පරීක්ෂාව හා නිමාව ය.
(3) නිමාව, කැපීම, මැසීම හා ඇසුරුම්කරණය ය.
(4) කැපීම, මැසීම, ඇසුරුම්කරණය හා නිමි ඇඳුම්වල තත්ත්ව පරීක්ෂාව ය.
(5) කැපීම, මැසීම, ඇසුරුම්කරණය හා නිමාව ය.

38. ඇඳුම් භාවිතය ආරම්භ වූ මුල් යුගවලදී ඇඳුම් භාවිත කිරීමේ මූලික අරමුණ වූයේ ,

(1) විවිධ තරාතිරම් හා සමාජ මට්ටම් වෙන්කර දැක්වීමයි.
(2) ජීවනෝපායන් ලෙස ඇඳුම් නිර්මාණය කිරීමයි.
(3) අහිතකර පාරිසරික තත්ත්වවලින් ශරීරය ආවරණය කර ගැනීමයි.
(4) ජීවත්වන පරිසරයේදී එකිනෙකා වෙන්කර හඳුනාගැනීමයි.
(5) ගොවිතැන් කටයුතුවලදී විය හැකි බාහිර උවදුරුවලින් ආරක්ෂාවීමයි.

39. රෙදි විවීම පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මුල් අවධියේදී රෙදි විවීම සඳහා ශාක කෙඳි පමණක් භාවිතවිය.
(2) රෙදි විවීම ආරම්භ වූයේ අත් යන්ත්‍ර සොයා ගැනීමෙන් පසුවය.
(3) මුල් අවධියේදී රෙදි විවීම සඳහා දැවමය යන්ත්‍ර භාවිතවිය
(4) මුල් අවධියේදී රෙදි විවීම සඳහා සත්ත්ව කෙඳි පමණක් භාවිතවිය.
(5) මුල් අවධියේදී රෙදි විවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය අවට පරිසරයෙන් සොයාගැනීම අසීරුවිය.

40. ඇඟලුම් කර්මාන්ත ශාලාවක ප්‍රධාන, කෘත්‍ය වන්නේ

(1) කෙඳි භාවිතයෙන් නූල් නිපදවීමයි.
(2) නූල් භාවිතයෙන් රෙදි නිපදවීමයි.
(3) රෙදි පෙර පිරියම් කිරීමට භාජනය කිරීමයි.
(4) රෙදිවලට විශේෂ නිමාවක් ලබාදීමයි.
(5) රෙදි භාවිතයෙන් ඇඳුම් නිර්මාණය කිරීමයි.

Education NCP - www.edncp.lk

41. නිමි ඇඳුම් නිෂ්පාදනයේදී ඇඟලුම් කර්මාන්ත ශාලාවක් තුළදී සිදු නොවන ක්‍රියාවලිය වන්නේ,
(1) පිරි සැලසුම් සැකසීමයි.
(2) මෝස්තර නිර්මාණයයි.
(3) මාකර් සටහන් තැබීමයි.
(4) ඇසුරුම්කරණය යි.
(5) නිමි ඇඳුම්වල තත්ත්ව පරීක්ෂාවයි.

42. ඇඳුම් නිර්මාණයේදී මෝස්තර නිර්මාණ ශිල්පියා විසින් අඳිනු ලබන මෝස්තරය හඳුන්වන්නේ කුමන නමකින්ද?
(1) පිරිසැලසුම
(2) ජ්‍යාමිතික සටහන
(3) මාකර් සටහන
(4) පතොරම
(5) නියැදිය

43. ඇඟලුම් නිෂ්පාදනය සඳහා රෙදි කැපීමෙන් පසු කළයුතු අත්‍යාවශ්‍ය ක්‍රියාවකි,
(1) දල කැපීම
(2) නිමාව
(3) තත්ත්ව පරීක්ෂාව
(4) ලේබල් කිරීම
(5) ඇසුරුම්කරණය

44. 120 cm පළල සමචතුරස්‍රාකාර මේසයක් සඳහා යෝග්‍ය මේස රෙද්දේ පළල කොපමණද?
(1) 150 cm
(2) 160 cm
(3) 180 cm
(4) 200 cm
(5) 220 cm

45. මේස දරණුව ක්විල්ට් කිරීමේදී රැළි වැටීම වළක්වාගැනීමට අනුගමනය කළ හැක්කේ,
(1) වටේට ඇති පැඩිං කොටස් කපා ඉවත් කිරීම යි.
(2) ගැළපෙන වර්ණයකින් බඳන වාටියක් යෙදීම යි.
(3) වටේට ඇති මැහුම් පාර නොකැපෙන සේ කැපුම් අද්දර යෙදීම යි.
(4) මධ්‍යයේ සිට පිටතට ක්විල්ට් කිරීම යි.
(5) පිටත සිට ඇතුළට ක්විල්ට් කිරීම යි.

46. පහත සඳහන් මැහුම් ක්‍රම අතරින් රෙද්දේ මතුපිටින් ඉහලට එසවී පිම්බුන ස්වභාවයක් ගන්නා මැහුම් ක්‍රමය කුමක්ද?
(1) දම්වැල් මැස්ම
(2) සැටින් මැස්ම
(3) නැටි මැස්ම
(4) මාළු කටු මැස්ම
(5) බුලියන් මැස්ම

47. ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළ වර්ෂයකි ,
(1) 1948
(2) 1954
(3) 1977
(4) 1995
(5) 2015

48. කපු කෙඳි වෙන්කරගනු ලබන්නේ
(1) කපු ශාකයේ කඳේ බාහික සෛලවලිනි.
(2) කපු ශාකයේ කඳේ පොත්තෙනි.
(3) කපු ගෙඩි වලිනි.
(4) කපු පත්‍ර වලිනි.
(5) කපු කඳෙන් හා පත්‍රවලිනි.

49. ස්වභාවික බහුඅවයවික නැවත සකස් කිරීමෙන් නිපදවා ගනු ලබන කෙඳි වර්ගයකි.
(1) විස්කෝස්
(2) නයිලෝන්
(3) ඕර්ලෝන්
(4) ඇස්බැස්ටෝස්
(5) වීදුරු

50. කෘතිම බහු අවයවික භාවිතයෙන් සකස් කර ගන්නා කෙඳි වර්ගයකි
(1) විස්කෝස්
(2) කේසීන්
(3) ඕර්ලෝන්
(4) ඇස්බැස්ටෝස්
(5) වීදුරු

Education NCP - www.edncp.lk